**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**නීතිවේදී උපාධි වැඩසටහන - 4 වන මට්ටම**
**දෙවන අඛණ්ඩ ඇගැයීම් පරීක්ෂණය - 2015**
**පවුල් නීතිය - LWU 2313**
**කාලය - පැය 01 යි**

---

දිනය 2015 නොවැම්බර් මස 11 වන දින වේලාව: ප.ව. 3.00 සිට 4.00 දක්වා

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. ලංකාවේ අදාල වන රෝම ලන්දේසි නීතිය යටතේ භාර්යාවගේ තත්ත්වය, ඇගේ අයිතිවාසිකම් හා යුතුකම් විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

2. සුමනාගේ මාමා විසින් ඉදිරිපත් කරනු ලැබූ විවාහ යෝජනාවක් අනුව සුමනා හා විමල් 2008 වසරේ දී සාමාන්‍ය නීතිය යටතේ විවාහ වූහ. විවාහ මංගල්‍යා දිනයේ දී එයට සහභාගී වූ ආරාධිතයන් ඉදිරියේ දී සුමනාගේ පියා විසින් මොණරාගල පිහිටි අක්කර දෙකක ඉඩමක් සඳහා වූ තෑගි ඔප්පුවක් හා රුපියල් මිලියනයක් දෑවැද්ද වශයෙන් මනාලයාට භාර දෙන ලදී. සුමනාගේ පියා විසින් දෙන ලද දෑවැදි මුදලින් මොණරාගල පිහිටි ඉඩමේ නව නිවසක් ඉදි කරන තෙක් සුමනා හා විමල් විවාහ උත්සවයෙන් පසුව සුමනාගේ දෙමාපියන්ගේ නිවසේ වාසය කළහ. 2011 දී ඔවුහු නව නිවසේ පදිංචියට ගියහ.

 මොණරාගල නව නිවස හුදෙකලා පෙදෙසක පිහිටා තිබූ හෙයින් තමන්ට එහි වාසය කළ නොහැකි බව සුමනා නිරතුරුවම පැමිණිලි කළාය. එම නිවස විකුණා කොළඹ නව නිවසක් ඉදි කරන ලෙස ඇය විමල්ට කියා සිටියාය. එහෙත් කොළඹ ඉඩමක තවත් නිවසක් ඉදි කිරීම සඳහා තමන්ට මුදල් නොමැති බව පවසමින් විමල් එසේ කටයුතු කිරීම ප්‍රතික්ෂේප කළේය. මේ කරුණ පිළිබඳව ඔවුහු නිරන්තරයෙන් ආරවුල් ඇති කර ගත්හ. දිනක් විමල් කාර්යාලයට ගිය පසු සුමනා තම බඩුබාහිරාදිය රැගෙන සිය දෙමාපියන් කරා ගියාය. ඇය ආපසු කැඳවාගෙන ඒම සඳහා විමල් විසින් ගනු ලැබූ සෑම ප්‍රයත්නයක්ම අසාර්ථක විය. ද්වේශ සහගත හැර යාම මත සුමනාට එරෙහිව දික්කසාදයක් ලබා ගැනීම සඳහා විමල් නඩුවක් පැවරීය. සුමනා ද විමල්ට එරෙහිව එම කරුණ මතම දික්සාදයක් ඉල්ලා නඩු පැවරුවාය.

 (අ) අධිකරණය විසින් දික්කසාදය ලබා දුනහොත් දෑවැදි දේපල සම්බන්ධයෙන් එක් එක් පාර්ශවය මුහුණ දෙන තත්ත්වය පිළිබඳ නෛතික මතය ලියා දක්වන්න. විනිශ්චිත නඩු තීරණ ඉදිරිපත් කරමින් ඔබේ නෛතික මතය තහවුරු කළ යුතු වේ.

 (ආ) විවාහ දිනයේ දී සුමනාගේ පියා අදාල දේපල සුමනාට භාර දෙන ලද්දේ නම් තත්ත්වය කෙසේ වන්නේ ද?

හිමිකම් ඇවිරිණි
***********

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**LL.B. DEGREE PROGRAMME – LEVEL 4**

**2ND CONTINUOUS ASSESSMENT TEST – 2015**

**FAMILY LAW - LWU 2313**

**DURATION – 01 HOUR**

---

Date: 11th November 2015 Time: 3.00 p.m – 4'00 p.m.

---

Answer **ONE** question only.
Illegible handwriting will be penalized.

1. Discuss with reference to case law the status, rights and duties of the wife under Roman Dutch Law as applied in Sri Lanka.

2. Sumana and Wimal married in 2008 under General Law on a marriage proposal made by an uncle of Sumana. On the day of wedding Sumana's father gave a deed of gift for two acre land in Moneragala and money to the value of one million as dowry to the bride groom in the presence of invitees of the wedding. Thereafter Sumana and Wimal lived in the parental home of Sumana until they constructed a new house on the land in Moneragala from the dowry money given by Sumana's father. They shifted to the new house in 2011.

   Sumana frequently complained that she cannot stay in the house in Moneragala as it was situated in a lonely area. She wanted Wimal to sell the house and put up a new house in Colombo. But Wimal refused to do so on the ground that he did not have money to construct another house on a land in Colombo. They quarreled with each other frequently on this issue. One day when Wimal went to office, Sumana took all her belongings and went to her parents home. Many attempts by Wimal to bring her back failed. Wimal filed an action against Sumana for divorce based on malicious desertion. Sumana made a counter claim for divorce against Wimal on the same ground.

   (a) Write a legal opinion on the situation faced by each of the parties as regards the dowry property if divorce is granted by the court. You should support your opinion using case law.

   (b) What would be the position if Sumana's father transferred the property to Sumana on the day of wedding?

COPYRIGHTS RESERVED
**********************